සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email - sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය** / Editors
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක** /Asst Editor
**ක්‍රීඩා සංස්කාරක** / Sports Editor
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා** / Graphics
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ**/ Photography
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම්** / Advrertising
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත



# යහපාලනය යටින් හාරන ඌරු මීයෝ



**ගාමිණී වියන්ගොඩ**

ආයුධ බිම තබා යටත් වූ පොලිස් නිලධාරීන් 700 ක් ඝාතනය කිරීම අපරාධයක් සේ නොගැනෙන නීතියක් තුළ, වාහනයක් අවභාවිත කිරීම අපරාධයක් වෙයි. කරුණා අම්මාන්ව නොවැ 29 වන දා අත්අඩංගුවට ගැනුණේ දෙවැනි අපරාධයට ය. ජීවිත 700 ක ඝාතනයක් වෙනුවෙන් අත්අඩංගුවට නොගැනුණු කෙනෙකු වාහන අවභාවිතයක් අරභයා අත්අඩංගුවට ගැනීම මගින් පෙන්නුම් කරන්නේ, අප රටේ නීතිය ක්‍රියාත්මක වීමේ ඇති අශෝභනත්වය සහ අමානුෂිකත්වයයි.

රජයේ වාහනයක් අවභාවිත කොට රජයට රුපියල් 146,690 ක් හෙවත් මිලියන අරික්කාලක පාඩුවක් සිදු කළා යැයි කියන වරදට, හිටපු එස්.ටී.එෆ්. ප්‍රධානියෙකු අත්අඩංගුවට ගැනුණි. ඉන් දෙදිනකට පසු, මේ පොලිස් නිලධාරියාව ඇප මත නිදහස් කෙරුණි. එවැන්නෙකු එක පැයකටවත් අත්අඩංගුවට ගැනීම නොම්මර එකේ විකාරයක් බව ආණ්ඩුවට අවබෝධ වී ඇති සැටියෙකි. එය විකාරයක් වන්නේ ඇයි? "හෙල්පිං හම්බන්තොටින්" මිලියන 86 ක් වංචා කිරීමට තැත් කළ මහින්ද රාජපක්ෂව එදා නිදහස් කිරීම ගැන දැන් තමන් කණගාටු වන බව කී හිටපු අගවිනිසුරු සරත් එන්. සිල්වා සහ මහින්ද රාජපක්ෂ තවමත් නිරුපද්‍රිත නිසා ය. රුපියල් මිලියන 1500 කට අධික මිග් යානා ගනුදෙනුව සහ මිලියන 3000 කට අධික ඇවන්ගාඩ් සිද්ධිය සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂ නිරුපද්‍රිත නිසා ය. කාර්ල්ටන් හවුස් සහ සිරිලිය ගිණුමට අදාළ රුපියල් මිලියන 200 ක මුදල් අවභාවිතය ගැන ශිරන්ති රාජපක්ෂ නිරුපද්‍රිත නිසා ය. රුපියල් මිලියන 800 කට අධික දේපළ සහ මුදල් විශුද්ධකරණය ගැන බැසිල් රාජපක්ෂ නිරුපද්‍රිත නිසා ය. රුපියල් මිලියන 290 ක මුදල් විශුද්ධිකරණය ගැන නාමල් රාජපක්ෂ නිරුපද්‍රිත නිසා ය. මීට අමතරව, යෝෂිත රාජපක්ෂ, මහින්දානන්ද අළුත්ගමගේ, ජොන්ස්ටන් ප්‍රනාන්දු, කෙහෙලිය රඹුක්වැල්ල, විමල් වීරවංශ සහ බිරිඳ, උදය ගම්මන්පිල, සජින් වාස් ගුණවර්ධන, ලලිත් වීරතුංග, ගාමිණී සෙනරත්, ටිරාන් අලස්, නාලක ගොඩහේවා ආදී තවත් විශාල පිරිසක් තවමත් නිරුපද්‍රිත නිසා ය. මෙයින් ඇතැමෙකු සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ අදියර පසු කොට ඇතත්, අවසානයක සේයාවක්වත් පෙනෙන්ට නැත. යහපාලන ආණ්ඩුව බලයට පත්ව වසර දෙකක් තිස්සේ ඉවර කරගෙන ඇති එකම නඩුව දුමින්ද සිල්වාගේ නඩුව පමණි. එයද දූෂණයක් සම්බන්ධයෙන් නොව, මිනීමැරුමක් සම්බන්ධයෙනි.

2015 ජනවාරි 8 වැනි දා සිටම ගොඩනැගුණු නව දේශපාලනික රූප වින්‍යාසය තුළ, දූෂණයට එරෙහි ව්‍යායාමය ප්‍රායෝගික නොවන කර්තව්‍යයක් වී තිබේ. පරාජය වූ බලවේගය විවිධාකාරයෙන් ජයග්‍රාහී කඳවුර මෙහෙයවනු ලැබීම, මගහැර යා නොහැකි යථාර්ථයක් සේ අපට දිනපතා මුණගැසේ. එහි නූතන නිරූපණය අපට හමුවන්නේ, ලංකා ඊ නිව්සි කතුවරයාට එරෙහිව යහපාලන ආණ්ඩුවේ පාර්ශ්වකරුවන් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ දක්වන අදහස් උදහස් තුළ ය. එම වෙබ් අඩවිය සහ එහි කතුවරයා, 2015 ජනවාරියේ ජයග්‍රහණය සඳහා ඉත සිතින් කැපවීම, එම වෙබ් අඩවිය හෝ එහි කතුවරයා කළා යැයි කියන යම් වරදක් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක නොවී සිටීමට හේතුවක් විය යුතු නැත. එහෙත් මේ සිද්ධියේදී අපට පෙනෙන්නේ, පුද්ගලයෙකු කළා යැයි කියන වරදක් සම්බන්ධයෙන් පෞද්ගලිකව පලිගැනීම සඳහා නීතිය සහ අධිකරණ ක්‍රියාවලිය සීඝ්‍රගාමී වී ඇති ආකාරයකි. ඔහු සම්බන්ධයෙන් මේ සා කඩිනමින් අධිකරණ වරෙන්තුවක් නිකුත් වීම සමාන වන්නේ, හිටපු අගවිනිසුරු සරත් එන් සිල්වාගේ හිට්වන කෝපය මත ටෝනි එම්මානුවෙල් ප්‍රනාන්දු අවුරුද්දක් හිරේ ලෑ සිද්ධියටයි.

මේ ආශ්‍රයෙන් අප ඉදිරියේ බරපතල දේශපාලනික ප්‍රශ්නයක් මතු කරවයි. එනම්, මෙවැනි පීලි පැනීම් සඳහා අධිකරණය සහ වෙනත් රාජ්‍ය ආයතන ජවය ලබන්නේ කොතැනින්ද යන්නයි. ඊ*නිව්ස් කතුවරයාට එරෙහිව අවි අමෝරා ගත් පුද්ගලයෝ දෙදෙනෙක් වෙති. එක් කෙනෙකු වන්නේ, හේමන්ත වර්ණකුලසූරියයි. අනෙකා වන්නේ, අධිකරණ ඇමති විජයදාස රාජපක්ෂයි. දෙන්නාම නීතිඥයෝ ය. හේමන්ත වර්ණකුලසූරිය යනු, මහින්ද රාජපක්ෂගේ අවපාලනය වෙනුවෙන් දිවා රෑ කැඹුරූ පුද්ගලයෙකි. එසේ කොට, යහපාලන ජයග්‍රහණයෙන් ඉතා කෙටි කලක් ඇවෑමෙන් ඔහු ගැසූ කරණම, තනි වචනයකින් හැඳින්නුවොත්, නිහීන ය. පුද්ගල අවස්ථාවාදයකට වඩා එතැන ඇත්තේ, අමු අකෘතඥතාවකි. යහපාලන ජයග්‍රහණයෙන් පසු, එක් රූපවාහිනී සංවාදයකදී, මොහු තමාට එදා තානාපති තනතුරු පවා පිරිනැමූ හිටපු ජනාධිපතිවරයාව විවේචනය කළ නිර්දය ආකාරය සහ තමාට හැකි ඉහළින්ම එදා පරාජය කිරීමට වෙර දැරූ වර්තමාන ජනාධිපතිවරයාව මුරුංගා අත්තේ තබා වර්ණනා කළ ආකාරය, එම සංවාදයේම පාර්ශ්වකරුවෙකු වූ මා තුළ දැනවූයේ ඔක්කාරයකි. එහෙත් එම වර්ණනාව වෙනුවෙන් ඔහුට ක්ෂණික ප්‍රතිලාභ ලැබුණි. ඒ, විදුලි සංදේශ නියාමන අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ජනාධිපතිවරයා විසින් ඔහුව පත්කරනු ලැබීමෙනි. මේ පත්වීම විකෘතියක් වන්නේ, හුදෙක් ඔහු රාජපක්ෂවාදියෙකු වූ නිසාම නොවේ. නීතිඥයෙකු වශයෙන් ඔහු සිය වෘත්තිය සේවාව සපයන දුමින්ද සිල්වා, රූපවාහිනී නාලිකාවක හිමිකරුවෙකුගේ සහෝදරයා වීම නිසා ය. විදුලි සංදේශ නියාමන අධිකාරිය සහ විද්‍යුත් මාධ්‍ය ආයතන අතර පවතින නිසග සබඳතාව තුළ, ඒ අංශ දෙකම එක විට නියෝජනය කරන ඕනෑම කෙනෙකු ළබැඳියා අතර ගැටුමකට මැදි වනු ඇත.

8 වන පිටට